රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 34/95

මගේ අංකය: I/543ඊ02ඩී/02/94(ii)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 නොවැම්බර් 14 දින

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය අංශයේ, කණිෂ්ඨ සේවක, කම්කරු ශ්‍රේණිය හා රියදුරු**
**සේවයේ වැටුප් සංශෝධනය කිරීම**

1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් කම්කරු ශ්‍රේණිවලට අදල වැටුප් පරිමාණයන් සංශෝධනය කරමින් නිකුත් කරන ලද 1995.04.28 දිනැති අංක 14/95 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ද, රාජ්‍ය සේවයේ රියදුරන් සඳහා සංශෝධිත වැටුප් පරිමාණයන් අදල කරමින් නිකුත් කරන ලද 1995.03.20 දිනැති අංක 29/94 (i) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ද අවධානය යොමු කරවමි.

02. 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් කම්කරු ශ්‍රේණියේ ii හා iii පංතිවල වැටුප් පරිමාණයන් ද අනෙකුත් කණිෂ්ඨ සේවකයන්ගේ වැටුප් පරිමාණයන් ද පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමටත් එම වැටුප් සංශෝධනයන් 1995.11.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් රජය තීරණය කර ඇත.

| වැටුප් බණ්ඩය | රා.පරිච.37/92 හි වැටුප් පරිමාණය | සංශෝධිත වැටුප් පරිමාණය |
|---|---|---|
| එස් 1-1 | 21000-20x480-30600 | 25560-20x480-35160 |
| එස් 1-2 | 21480-15x480-5x660-31980 | 26040-15x480-5x660-36540 |
| එස් 1-3 | 22440-10 x480-8x660-32520 | 27000-10x480-8x660-37080 |
| එස් 1-4 | 23160-23 x660-38340 | 27960-23 x660-43140 |

03. රාජ්‍ය සේවයේ මෝටර් වාහන රියදුරන් සම්බන්ධයෙන් ද පහත සඳහන් වැටුප් පරිමාණයන් 1995.11.01 දින සිට ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

බරවාහන රියදුරන් - I පන්තිය - 35640-6x780-9x1200-51120
සැහැල්ලු ලොරි සහ සැහැල්ලු මෝටර් රථ රියදුරන්
- II 'අ' පන්තිය - 29400-5x660-11x780-41280
සැහැල්ලු වාහන රියදුරන් - II 'ආ' පන්තිය - 27960-23x660-43140

04. 1995.02.06 දිනැති අංක 3/95 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දැනටමත් වැටුප් සංශෝධනය කර ඇති තනතුරුවලට මෙම සංශෝධනය අදල නොවේ.

05. ශ්‍රී ලංකා ගුරු සේවය සම්බන්ධයෙන් ද මෙම සංශෝධන අදල නොවේ.

06. දැනට පවත්නා වැටුප් නව වැටුප්වලට පරිවර්තනය කරනුයේ පියවරින් පියවරට තැබීමේ පදනම අනුව ය. දැනට පවත්නා වැටුප යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව හිමි විය යුතු වැටුප වේ.

07. දැනට පවත්නා වැටුප් වර්ධක දින නොවෙනස්ව පවතිනු ඇත.

08. 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැටුප් පරිමාණයන් යටතේ නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් ඊට අදාල නව වැටුප් පරිමාණයන්හි අනුරූපී පියවරේදී ක්‍රියාත්මක වනු ඇත.

09. තවදුරටත් උපදෙස් නිකුත් කරන තෙක් මෙම චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය නොසලකා 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි මාණ්ඩලික නිලධාරියා හෝ යටත් නිලධාරියා හෝ කණිෂ්ඨ සේවකයා යන නිර්වචනය යටතේ නිලධාරියාගේ වර්තමාන තත්ත්වය නොවෙනස්ව පවතිනු ඇත.

10. තවදුරටත් උපදෙස් නිකුත් කරන තෙක් මෙම චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය නොසලකා සංයුක්ත දීමනා හිමිකම් හා දුම්රිය බලපත්‍ර හිමිකම 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මත පදනම් වනු ඇත.

11. නිලධාරියාගේ නව වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කිරීම ද 1992.12.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/92 හි ප්‍රතිශතයන්ට අනුව සිදුවිය යුතුය.

12.. සංශෝධනය කරන ලද වැටුප් ගෙවිය යුත්තේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට 1995 අයවැය ප්‍රතිපාදන මගින් සලස්වා ඇති පුනරාවර්තන ප්‍රතිපාදනවලිනි. අතිරේක අරමුදල් අවශ්‍ය වන්නේ නම් එවැනි අතිරේක අරමුදල් ප්‍රමාණය ගණන් බලන ලද ආකාරය පැහැදිලි කරමින් ඉල්ලුම්පත්‍රයක් මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය. මෙම වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් ඉතිරිවීම් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වැය ශීර්ෂවල තිබෙන බැව් තහවුරු වනතුරු හෝ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වෙන් කිරීමක් ලබා ගන්නා තුරු හර කිරීම් නොකල යුතුය. අතිරික්තයන් ආවරණය කර ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙන් කිරීම් කරනු නොලබන බැව් පැහැදිලිව සටහන් කරගත යුතුය.

13. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය